# 1. සුබ අලුත් අවුරුද්දක් වේවා!

ගුරුතුමී : ජේසු පිහිටයි ! සැම දෙනාට ම
සුබ අලුත් අවුරුද්දක් වේවා !

ළමයි : අපේ ගුරුතුමීටත් සුබ අලුත් අවුරුද්දක් වේවා !





1. රඹුනීය. - 120375

ගුරුතුමී : ඔයාලාට අලුත් ආගම් පොත ලැබුණා ද?

ළමයි : එහෙයි, අපට අලුත්
පොත් ඔක්කොම ලැබුණා.
අපි ඒවාට ලස්සන කවර දැම්මා.
ආගම පොතේ පිට කවරයේ
ජේසුගේ ලස්සන
පින්තූරයකුත් ඇලෙව්වා.

ගුරුතුමී : ඔය දරුවෝ කරපු දේ වටිනවා.
මේ පොත් අපට ලබා දෙන්න බොහෝ
අය මහන්සි වෙනවා. විශාල මුදලකුත්
වැය වෙනවා. මේ පොත්
දෙන්නේ, ඔය දරුවන්ට මහන්සි වී
ඉගෙන ගන්නටයි.

ළමයි : අපි පොත් පිරිසිදුව තබා ගන්නම්.
අලුත් පන්තිය ලස්සනට තබා ගන්නම්
මහන්සි වී ඉගෙන ගන්නම්.

ගුරුතුමී : අපට මේ සියල්ල ලබා දුන් දෙවි පියාට
ස්තුති කරමු. මේ ගීය ගායනා කරමු.

1. ජීවිතේ මට දුන්නු දෙවිතුමනේ
මගේ පණනල ඔබ අතේ රැඳුණේ
රැක ගන්න සමිඳුනි මා///

2. හිරු උදා වී දවස ඇරඹෙන්නේ
දිවිය ගෙවුමට මා වෙහෙස වන්නේ
රැක ගන්න සමිඳුනි මා

## පැවරුම්

1. ඔබගේ පන්තිය භාර අලුත් ගුරුතුමියට වැඳ ආචාර කරන්න.
2. ඔබගේ පන්ති භාර ගුරුතුමියගේ නම සහ ඔබට ආගම විෂයය උගන්වන්නේ වෙනත් ගුරුතුමියක් නම් ඇගේ නම ද ඔබගේ අභ්‍යාස පොතේ ලියන්න.
3. අලුත් අවුරුද්ද, අලුත් පන්තිය, අලුත් පොත්පත් ඔබට ලබා දුන්නේ දෙවි පියායි. එතුමාට සැම දා ම 'ස්තුති' කරන්න.